EXAMRESULTS.LK 292064

OL/2019/33-S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது /All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

33 | S | I

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019

2019.12.04 / 1300 - 1400

ඉතිහාසය I
வரலாறு I
History I

පැය එකයි
ஒரு மணித்தியாலம்
One hour

**සැලකිය යුතුයි :**

(i) **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු **80** ක් හිමි වේ.

(ii) අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ** පිළිතුර තෝරන්න.

(iii) **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**

(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස, දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

**1.** නාණක විද්‍යාව විෂයයෙන් හදාරනු ලබන්නේ මින් කුමක් පිළිබඳව ද?
(1) ලෝහ කර්මාන්තය (2) වාස්තු විද්‍යාව (3) කුඹල් කර්මාන්තය (4) පැරණි කාසි

**2.** අනුරාධපුර අවධියේ සිට කෝට්ටේ අවධියේ ආරම්භය දක්වා ඉතිහාසය හැදෑරීමේ දී උපකාරීවන දේශීය සාහිත්‍යයෙ මූලාශ්‍ර බොහොමයක් රචනා වී ඇත්තේ කවර අරමුණක් මූල්කර ගෙන ද?
(1) ආගමික (2) ආර්ථික (3) දේශපාලන (4) සමාජයීය

**3.** ප්‍රාග් ඓතිහාසික මානවයා ජීවත් වූවා යැයි සැලකෙන 'මිනිහාගල්කන්ද' අයත් වන්නේ කුමන වාසස්ථාන වර්ගයකට ද?
(1) පහතරට තෙත් කලාපීය ලෙන් (2) පහතරට වියළි කලාපීය එළිමහන් කඳවුරු
(3) වෙරළාශ්‍රිත එළිමහන් කඳවුරු (4) පහතරට වියළි කලාපීය ලෙන්

**4.** පරුමකවරුන්ට පැවරී තිබූ මූලික කාර්යය වූයේ,
(1) රජතුමාට උපදෙස් දීම ය. (2) ගම්වැසියන්ගේ සුභසාධන කටයුතු ඉටු කිරීම ය.
(3) නගරයක් භාරව කටයුතු කිරීම ය. (4) වැව් පද්ධතියක් භාරව කටයුතු කිරීම ය.

- පහත දැක්වෙන ඓතිහාසික සිදුවීම් ඇසුරෙන් **5** සහ **6** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – රුවන්වැලි මහා සෑය ඉදි කිරීම
B – ලම්භකර්ණ රාජවංශයේ ආරම්භක පාලකයා වීම
C – ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම
D – ප්‍රථම සංවිධානාත්මක සටන් ව්‍යාපාරය ඇරඹීම
E – පළමුවරට විශාල ප්‍රමාණයේ වැව් ඉදි කිරීම

**5.** දුටුගැමුණු රාජ්‍ය සමයට අයත්වන සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා E

**6.** වසභ රාජ්‍ය සමයට අයත්වන සිදුවීම් දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා B (2) A හා D (3) B හා C (4) B හා E

**7.** රාජ්‍යත්වයේ බලය ක්‍රමයෙන් වර්ධනය වීමේ ප්‍රධාන ප්‍රතිඵලය වූයේ,
(1) බලය විමධ්‍යගත වීම ය. (2) රාජධානි අතර ගැටුම් ඇති වීම ය.
(3) ප්‍රාදේශීය පාලකයන් බලවත් වීම ය. (4) බලය මධ්‍යගත වීම ය.

**8.** ශ්‍රී ලංකාවේ ඇතැම් පාලකයන් අසල්වැසි රටවල් සමග විවාහ සබඳතා ඇති කර ගැනීමෙන් අනාවරණය වන්නේ,
(1) අසල්වැසි රටවල පාලකයන් හා ලාංකික පාලකයන් අතර සුහදතාව පැවති බව යි.
(2) ලාංකික රජවරුන්ගේ බලපරාක්‍රමය විදේශ රටවල ද ව්‍යාප්තව පැවති බව යි.
(3) ඥාති සබඳතා තුළින් දේශපාලන බලය ස්ථාවර කරගත් බව යි.
(4) විදේශ කුමාරිකාවන් සරණපාවා ගැනීම මෙරට රජවරුන්ගේ චාරිත්‍රයක්ව පැවති බව යි.

[දෙවැනි පිටුව බලන්න.

9. අතීතයේ දී විවිධ ජාතීන් අතුරෙන් වැඩි පිරිසක් මෙරටට පැමිණ ඇත්තේ,
(1) සංචාරය පිණිස ය. (2) වෙළදාම පිණිස ය.
(3) අධ්‍යාපන කටයුතු පිණිස ය. (4) බලය අල්ලා ගැනීම පිණිස ය.

10. දීමනා හා සම්බන්ධ ඇතැම් ශිලාලිපිවල බල්ලා හා කපුටා සංකේතවත් කිරීමෙන් ජන සමාජයට ලබා දුන් පණිවුඩය වන්නේ,
(1) දීමනාවෙන් කොටසක් බලු කපුටන්ට ද හිමි බව ය.
(2) දීමනාවට බාධා කළවුන් මතු ආත්මයේ දී එවැනි සතුන් ව ඉපදෙන බව ය.
(3) දීමනාව බලු කපුටන්ගෙන් පවා ආරක්ෂා කළ යුතු බව ය.
(4) දීමනාවට අයත් ප්‍රදේශය බලු කපුටන්ට අභය භූමියක් වන බව ය.

11. කලාත්මක බව, ජල කළමනාකරණය හා තාක්ෂණය සංකලනය වූ විශිෂ්ට නිර්මාණයක් ලෙස අගය කළ හැක්කේ,
(1) සොරොව්ව ය. (2) ගල්පාලම ය. (3) යෝධ ඇළ ය. (4) කුට්ටම් පොකුණ ය.

12. අතීතයේ දී පානීය ජලය ලබා ගැනීමට ළිං සෑදීමේ දී විශාල ප්‍රමාණයේ මැටි බඳුන් කිහිපයක් ළිඳ තුළට බස්සවා, එහි බිත්ති ආවරණය කිරීමෙන් බලාපොරොත්තු වූයේ,
(1) ජලයේ කිවුල් බව නැති කිරීම ය. (2) ජලය වාෂ්ප වීම වළක්වා ගැනීම ය.
(3) ජලය වඩාත් සිසිල්ව තබා ගැනීම ය. (4) ජලය පිරිසිදුව ලබා ගැනීම ය.

- පහත තොරතුරු ඇසුරෙන් **13** සහ **14** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  - A – විශාල ජල ධාරිතාවක් දරා සිටීම
  - B – වැව් ජලය ප්‍රධාන ඇළට නිකුත් කිරීම
  - C – ශක්තිමත්ව ඉදි කිරීම සඳහා පිහිටි ගලක් හෝ කඳු ගැට දෙකක් තෝරා ගැනීම
  - D – ගල් කුට්ටි යොදා ගංගාවක් හරස් කර ජලය වෙනත් දිශාවකට හැරවීම
  - E – වැවට එකතුවන රොන්මඩ ශුද්ධ කිරීම

13. වැව් බැම්ම හා සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා C (2) A හා D (3) B හා C (4) B හා D

14. සොරොව් සම්බන්ධ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A හා E (2) B හා D (3) B හා E (4) C හා D

15. සැඟවී සිටින අපරාධකරුවකු අල්ලා ගැනීම සඳහා අතීත පාලකයන් යෙදූ උපක්‍රමය වන්නේ,
(1) අපරාධකරුගේ පවුලේ ඥාතීන් අත් අඩංගුවට ගැනීම ය.
(2) අපරාධකරු අල්ලා ගන්නා තෙක් ඔහු ජීවත් වූ ගමේ වැසියන්ගෙන් බද්දක් අය කිරීම ය.
(3) අපරාධකරු පිළිබඳ තොරතුරු සපයන අයට ත්‍යාග ලබා දීම ය.
(4) අපරාධකරු ඇල්ලීම සඳහා ක්‍රමවත් වරපුරුෂ සේවාවක් යොදා ගැනීම ය.

16. පැරණි ශ්‍රී ලංකාවේ කාන්තාව විශේෂ ගෞරවාදරයට පත්වීමට බල පෑ ප්‍රබලම සාධකය වූයේ,
(1) ස්වාමි භාර්යා ගෞරවය සුරකිමින් ජීවත් වීම ය.
(2) කුල සිරිත් ආරක්ෂා කරමින් ජීවත් වීම ය.
(3) මව්වරුන් ලෙස වගකීම් උසුලමින් කටයුතු කිරීම ය.
(4) සූප ශාස්ත්‍රය පිළිබඳ දක්ෂතා දැක්වීම ය.

- පහත වගුවේ A සිට F දක්වා ඇති තොරතුරු ඇසුරෙන් **17** සහ **18** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| රජතුමා | ආක්‍රමණිකයා | ඓතිහාසික සිදුවීම |
|---|---|---|
| A - හතරවන භුවනෙකබාහු | C - චන්ද්‍රභානු | E - ඉබන්බතුතාගේ පැමිණීම |
| B - දෙවන පරාක්‍රමබාහු | D - චෙන්හෝ | F - බෙලිගල දළදාමැඳුර ඉදි කිරීම |

17. දඹදෙණි රාජධානි සමය පිළිබඳ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, C හා E (2) A, D හා E (3) B, C හා F (4) B, D හා F

18. ගම්පොළ රාජධානි සමය පිළිබඳ තොරතුරු දැක්වෙන පිළිතුර කුමක් ද?
(1) A, C හා F (2) A, D හා E (3) B, C හා F (4) B, D හා E

19. මහනුවර රජ කළ නායක්කර් වංශික පාලකයන් අනුගමනය කළ රාජ්‍ය උරුම සම්ප්‍රදාය වූයේ රජුගෙන් පසුව, ඔහුගේ
(1) බිසවගේ සොහොයුරා රජවීම ය. (2) වැඩිමහල් සොහොයුරා රජවීම ය.
(3) පුතා රජවීම ය. (4) අගබිසව රජවීම ය.

20. උඩරට පාලන සංවිධානය තුළ බද්දෙ සංවිධානය යටතේ 'මඩිගෙ බද්ද' නමින් හැඳින් වූ කාර්යාංශයට පැවරී තිබූ කටයුත්ත කුමක් ද?
(1) ප්‍රවාහනය (2) රෙදි විවීම (3) ඇතුන් ඇල්ලීම (4) කුරුඳු තැලීම

[තුන්වැනි පිටුව බලන්න.

**21.** උඩරට පාලකයන් හා පෘතුගීසීන් අතර සටන් ඇති වූ ස්ථාන I තීරුවේ ද, ඒවා මෙහෙය වූ පෘතුගීසි කපිතාන් ජනරාල්වරුන් II තීරුවේ ද දැක්වේ. I තීරුව අනුව II තීරුව ගැළපූ විට නිවැරදි පිළිතුර කුමක් ද?

| I තීරුව | II තීරුව |
|---|---|
| 1. දන්තුරේ | A - ජෙරනිමෝ ද අසවේදු |
| 2. බලන | B - දියෝගු ද මෙලෝ |
| 3. රන්දෙණිවෙල | C - පේරෝ ලෝපේස් ද සූසා |
| 4. ගන්නෝරුව | D - කොන්ස්තන්තීනු ද සා |

(1) B, A, C, D (2) B, C, D, A (3) C, A, D, B (4) C, D, A, B

**22.** උඩරට රජුන් සමග කටයුතු කිරීමේ දී ලන්දේසීන් අනුගමනය කළ ප්‍රතිපත්තියේ කැපී පෙනෙන ලක්ෂණය වූයේ,
(1) හැකිතාක් ආර්ථික ලාභ ලබා ගැනීම ය. (2) රෙපරමාදු ආගම ප්‍රචාරය කිරීම ය.
(3) උඩරට රාජ්‍යයේ කොටස් අල්ලා ගැනීම ය. (4) විදේශ සබඳතා අවහිර කිරීම ය.

- පහත A, B, C හා D යටතේ දක්වා ඇති එක් එක් යුගලයෙහි පළමුවන හා දෙවන අදහස් අතර සම්බන්ධතාවය පරීක්ෂාකර බලා අංක **23** සිට **26** දක්වා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A – 1. බැස්ටීලයට පහරදීම
2. ප්‍රංශ විප්ලවය

B – 1. ජෝර්ජ් වොෂින්ටන්
2. ඇමෙරිකානු විප්ලවය

C – 1. සාර් පාලනය
2. රුසියන් විප්ලවය

D – 1. පරමාණු බෝම්බ හෙළීම
2. පළමුවන ලෝක මහා සංග්‍රාමය

**23.** පළමුවැන්න බිඳවැටීම කෙරෙහි දෙවැන්නේ බලපෑම දැක්වෙන යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**24.** දෙවැන්නේ ආරම්භයට පළමුවැන්න ක්‍රියාත්මක වීම හේතු වූ බව දැක්වෙන යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**25.** දෙවැන්නේ සාර්ථකත්වයට පළමුවැන්නේ මගපෙන්වීම හේතු වූ බව දැක්වෙන යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**26.** පළමුවැන්න හා දෙවැන්න අතර සම්බන්ධතාවක් **නොදැක්වෙන** යුගලය,
(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**27.** කාර්මික විප්ලව සමයේ මැකඩම් ක්‍රමය භාවිත කරන ලද්දේ,
(1) යකඩ හා වානේ නිපදවීමට ය. (2) දුම්රිය මාර්ග තැනීමට ය.
(3) පාලම් ඉදි කිරීමට ය. (4) මහාමාර්ග තැනීමට ය.

**28.** පහත දැක්වෙන කාර්මීකරණයේ ප්‍රතිඵල අතුරෙන් ආර්ථික ක්ෂේත්‍රයේ ඇති වූ වෙනස්කම් දැක්වෙන පිළිතුර කුමක් ද?
A – පරිසර දූෂණය ආරම්භ වීම
B – භාණ්ඩ නිෂ්පාදනය වේගවත් වීම
C – නාගරිකරණය ව්‍යාප්ත වීම
D – මුඩුක්කු හා පැල්පත් ව්‍යාප්ත වීම
(1) A (2) B (3) C (4) D

**29.** පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් ෆ්‍රෙඩ්රික් නෝර්ත් ආණ්ඩුකාරවරයා හා සම්බන්ධ ප්‍රකාශ දැක්වෙන පිළිතුර කුමක් ද?
A – සිවිල් නිලධාරියකු වූ ජෝන් ඩොයිලිගේ සහාය ලබා ගැනීම
B – මුත්තුසාමි කුමරු උඩරට රජු වශයෙන් ප්‍රකාශයට පත් කිරීම
C – සෙන්පති මැක්ඩොවල්ගේ නායකත්වයෙන් උඩරට ආක්‍රමණය කිරීම
D – රජුට හා ඔහුගේ ඥාතීන්ට උඩරට සිහසුනට තිබූ අයිතිය අහෝසි කිරීම
(1) A හා B (2) B හා C (3) B හා D (4) C හා D

**30.** 19 වන සියවසේ දී ශ්‍රී ලංකාවේ ඇති වූ ආගමික හා සංස්කෘතික ප්‍රබෝධය සම්බන්ධ අදහස් යුගල කිහිපයක් පහත දැක්වේ. ඒවායින් **නොගැළපෙන** යුගලය කුමක් ද?
(1) පංචමහාවාද පැවැත්වීම - මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි
(2) පෙරිය පුරාණම් ග්‍රන්ථය පරිවර්තනය කිරීම - ආරුමුග නාවලර්තුමා
(3) මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන ඇරඹීම - රත්මලානේ ධම්මාලෝක හිමි
(4) කොළඹ සහිරා විද්‍යාලය පිහිටුවීම - සිද්දි ලෙබ්බෙ මහතා

[ඉතිරිවැනි පිටුව බලන්න.

**31.** පහත A සිට D දක්වා දී ඇති ප්‍රකාශ ඇසුරෙන් ශ්‍රීමත් පොන්නම්බලම් රාමනාදන් පිළිබඳ නිවැරදි තොරතුරු ඇතුළත් පිළිතුර කුමක් ද?

A – කොළඹ සහිරා විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කිරීම

B – 1915 ඇති වූ කෝලාහලය මැඩලීමට යුද නීතිය පැන වූ අවස්ථාවේ දී බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැගීම

C – නාට්‍ය මගින් මධ්‍යසාරවල අහිසි විපාක සමාජගත කිරීම

D – ලංකා ජාතික සංගමය පිහිටුවීමට මූලිකත්වය ගෙන කටයුතු කිරීම

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**32.** යාපනය රාජ්‍යය සම්බන්ධයෙන් **සාවද්‍ය** ප්‍රකාශය කුමක් ද?

(1) විජය කුලංකෙ යාපන රාජ්‍යයේ ආරම්භක පාලකයා ලෙස සැලකේ.

(2) පෘතුගීසි විරෝධියකු වූ වීදිය බණ්ඩාර ආරක්ෂාව පතා යාපනයට පලායාම.

(3) 'යාල්පාන වෛපව මාලෛ' නැමති ග්‍රන්ථයේ යාපන රාජ්‍යය පිළිබඳ තොරතුරු ඇතුළත්ව ඇත.

(4) යාපනය කුරුඳු වගාවට ප්‍රසිද්ධ ප්‍රදේශයක් නිසා පෘතුගීසීන්ගේ අවධානයට යොමුවීම.

**33.** A සිට D දක්වා ඇති තනතුරු නාම අතුරෙන් සෝල්බරි සහ 1978 ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක වීමේ දී අහෝසි වූ තනතුරු නාම පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?

A – ආණ්ඩුකාරවරයා

B – අග්‍රාණ්ඩුකාරවරයා

C – නාමික විධායක ජනාධිපති

D – විධායක ජනාධිපති

(1) A හා B (2) A හා C (3) B හා C (4) B හා D

**34.** සෝල්බරි ආණ්ඩුක්‍රමයෙන් මෙරටට හඳුන්වාදුන් ප්‍රතිසංස්කරණයක් දැක්වෙන පිළිතුර කුමක් ද?

(1) රාජ්‍ය මන්ත්‍රණ සභාව පිහිටුවීම (2) සර්වජන ඡන්ද බලය ලබා දීම

(3) පාර්ලිමේන්තු ක්‍රමය හඳුන්වාදීම (4) විධායක කාරක සභා ක්‍රමය ඇති කිරීම

**35.** ශ්‍රී ලංකාවේ පැරණිම දේශපාලන පක්ෂය මින් කුමක් ද?

(1) ලංකා සමසමාජ පක්ෂය (2) එක්සත් ජාතික පක්ෂය

(3) ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (4) ලංකා කොමියුනිස්ට් පක්ෂය

**36.** පහත දැක්වෙන ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කරන ලද්දේ කවර අග්‍රාමාත්‍යවරයාගේ පාලන කාලයේ දී ද?

- සිංහල භාෂාව රාජ්‍ය භාෂාව බවට පත්කිරීම
- වරාය හා බස් ජනසතු කිරීම
- විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත්කිරීම

(1) ඩී. එස්. සේනානායක (2) ඩඩ්ලි සේනානායක

(3) එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක (4) සර් ජෝන් කොතලාවල

● පහත A, B, C හා D යටතේ දැක්වෙනුයේ ශ්‍රී ලංකාවේ සංවර්ධනය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයකි. එම තොරතුරු ආශ්‍රයෙන් ප්‍රශ්න අංක **37** හා **38**ට පිළිතුරු සපයන්න.

A – වියළි කලාපයේ මෙතෙක් ප්‍රයෝජනයට නොගත් ඉඩම් වී වගාවට යොදා ගැනීම

B – ඉහළ යන විදුලිබල ඉල්ලුම සපුරාලීමට විදුලිබල නිෂ්පාදනය වේගවත් කිරීම

C – රජය සතු ඉඩම් මහාපරිමාණ ව්‍යාපෘති සඳහා ලබා දීම

D – වතු බෝගවගාව තවදුරටත් ව්‍යාප්ත කොට ජාතික ආර්ථිකය ශක්තිමත් කිරීම

**37.** ඉහත ප්‍රකාශ අනුව ගොවිජනපද පිහිටුවීමේ මූලික අරමුණ ඇතුළත් අක්ෂරය,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**38.** බහුකාර්ය සංවර්ධන යෝජනා ක්‍රමයක් මගින් අපේක්ෂිත අරමුණක් ඇතුළත් අක්ෂරය,

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

**39.** 'ටෙනිස් පිටියේ දිවුරුම' සහ 'ස්ටේට්ස් ජනරාල් සභාව' පහත සඳහන් කිනම් ඓතිහාසික සිදුවීමක් හා සම්බන්ධ ද?

(1) ඇමෙරිකානු නිදහස් සටන (2) ප්‍රංශ විප්ලවය

(3) රුසියානු විප්ලවය (4) පළමුවන ලෝක මහා සංග්‍රාමය

**40.** අන්තර්ජාතික සාමය හා ආරක්ෂාව පවත්වා ගැනීම සඳහා රටකට ආර්ථික සම්බාධක පැනවීමේ වගකීම පැවරී ඇති, එක්සත් ජාතීන්ගේ සංවිධානයට අයත් ආයතනය වන්නේ,

(1) මහ ලේකම් කාර්යාලය යි. (2) මහා මණ්ඩලය යි.

(3) ආර්ථික හා සමාජ මණ්ඩලය යි. (4) ආරක්ෂක මණ්ඩලය යි.

* * *

292110

OL/2019/33-S-II

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**33 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
**General Certificate of Education (Ord. Level) Examination, December 2019**

**ඉතිහාසය II**
வரலாறு II
History II

2019.12.04 / 0830 - 1140

**පැය තුනයි**
மூன்று மணித்தியாலம்
*Three hours*

**අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time - 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.**

- ※ **I** කොටසේ ප්‍රශ්න අංක **1** අනිවාර්ය වේ.
- ※ **II** කොටසින් ප්‍රශ්න **හතරකට** ද, **III** කොටසින් ප්‍රශ්න **එකකට** ද පිළිතුරු සපයන්න.
- ※ පිළිතුරු සැපයිය යුතු මුළු ප්‍රශ්න සංඛ්‍යාව **හයකි.**

## I කොටස

**1. (අ)** පහත (i) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ශ්‍රී ලංකා සිතියමෙහි ද (ii) යටතේ දක්වා ඇති ඓතිහාසික ස්ථාන **සියල්ල ම** සපයා ඇති ලෝක සිතියම් කොටසෙහි ද ලකුණු කර නම් කරන්න.


(i) දැදුරු ඔය, කුඹුක්කන් ඔය, ගල්ඔය ජලාශය, පරාක්‍රම සමුද්‍රය, නකදිව, කයිට්ස් දූපත, ගොඩවාය, පඬුවස්නුවර, කෝණේශ්වරම් කෝවිල, පොල්ගොල්ල වේල්ල, මහාතිත්ථ, කොළඹ (ලකුණු 12 යි)

(ii) පර්සියන් බොක්ක, ලිස්බන්, මලක්කා සමුද්‍ර සන්ධිය, ඉතාලිය, කල්කටා, සුමාත්‍රා දූපත (ලකුණු 06 යි)

**(ආ)** (i) පහත *A*, *B*, *C* හා *D* යටතේ දක්වා ඇති ඓතිහාසික තොරතුරුවලට අදාළ පිළිතුරු **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියා දක්වන්න.

*A* - අනුරාධපුර රාජධානියේ අවසන් පාලකයා
*B* - සීතාවක මායාදුන්නේ රජුට නාවුක ආධාර සැපයූ කැලිකට් හි පාලකයා
*C* - අතීතයේ වෙළෙඳ මධ්‍යස්ථානයක් වූ කොන්ස්තන්තිනෝපල් නගරය වර්තමානයේ හඳුන්වන නම
*D* - සූවස් ඇළ ජනසතු කළ මිසර ජනාධිපතිවරයා (ලකුණු 04 යි)

● *A* සහ *B* යටතේ දක්වා ඇති පින්තූර අධ්‍යයනය කොට, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු අංක **අනුපිළිවෙළින්** ඔබේ පිළිතුරු පත්‍රයේ ලියන්න.



*A*

(ii) 1. *A* වලින් දැක්වෙන ශිලාලිපිය හඳුන්වන නම කුමක් ද?
2. එය කරවන ලද රජතුමාගේ නම කුමක් ද?
3. එම රජතුමා අයත් වූ රාජවංශය නම් කරන්න.
4. මෙම ශිලාලිපිය පිහිටුවා ඇති ඓතිහාසික නගරය සඳහන් කරන්න. (ලකුණු 04 යි)



*B*

(iii) 1. *B* වලින් දැක්වෙන පුද්ගලයාගේ නම කුමක් ද?
2. දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ දී මොහු කුමන රටක පාලකයා වී ද?
3. මොහුගේ දේශපාලන දර්ශනය හඳුන්වන නම කුමක් ද?
4. සතුරන් මර්දනය කිරීම සඳහා මොහු විසින් පිහිටුවා ගත් රහස් පොලිසිය හැඳින් වූ නම දක්වන්න. (ලකුණු 04 යි)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**2.** (i) ශිලාලිපි නිර්මාණය කර ඇති ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාවේ සිතියමක් අඳින ලද මුල්ම ග්‍රීක ජාතිකයා

*B* - අනුරාධපුර මුල් යුගයේ ශිලාලිපිවල භාවිත වූ අක්ෂරමාලාව හඳුන්වන නම

*C* - පුරාවිද්‍යාත්මක කැනීම්වලින් ශ්‍රී ලංකාවේ හමු වූ පැරණිතම කාසි හඳුන්වන නම

*D* - වසභ රාජ්‍ය සමයේ දී සාෂිගිරි (ඉසගිරි) ඇමතිවරයා විසින් නකදිව පාලනය කළ බව සඳහන් මූලාශ්‍රය

(මෙගස්තිනිස්, බ්‍රාහ්මී, සංස්කෘත, ටොලමි, කහාපණ, වල්ලිපුරම් රන් සන්නස, රිදී මස්ස, පනාකඩුව තඹ සන්නස) (ලකුණු 04 යි)

(iii) ඉතිහාසය ගොඩ නැගීමේ දී ශිලාලිපි වැදගත්වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

**3.** (i) ප්‍රාග් ඓතිහාසික මානවයන් මෙවලම් තැනීම සඳහා භාවිත කළ පාෂාණ වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් **දෙකක්** ද,

*B* - ඔවුන් දඩයම් කළ සත්ව වර්ග **දෙකක්** ද **පිළිවෙළින්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානව ජීවිතයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ති රටාවේ වර්ධනය වූ ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

**4.** (i) *A* - කුඩා ස්තූප ආවරණය කිරීම සඳහා තැනූ ගොඩනැගිල්ල

*B* - වැවක ඇතිවන දිය රැළිවලින් වැව් බැම්ම සේදී යාම වැළැක්වීම සඳහා කළ නිර්මාණය

*C* - අකුණු සැරවලින් ආරක්ෂා වීම සඳහා විශාල ස්තූප මුදුනේ සවි කළ උපකරණය

**පිළිවෙළින්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - මහවැලි ගඟ හා සම්බන්ධ පැරණි ඇළ මාර්ග **දෙකක්** ද

*B* - කලා ඔය හා මල්වතු ඔය හරස්කොට බඳවන ලද විශාල වැවක් බැගින් ද ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) උද්‍යාන අලංකරණය, ආරක්ෂාව වැනි කරුණු පදනම් කරගෙන පැරණි නගර නිර්මාණ තාක්ෂණයක් පැවති බව සීගිරිය ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ දී මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු **තුනක්** ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

**5.** (i) පෘතුගීසීන් ශ්‍රී ලංකාවට පැමිණෙන විට තිබූ රාජධානි **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - ක්‍රි.ව. 1505 දී ගාල්ලට ගොඩබට පළමු පෘතුගීසි නාවිකයා

*B* - ක්‍රි.ව. 1602 දී පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි රාජ දූතයා

*C* - ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකරගත් උඩරට රජතුමා

*D* - ක්‍රි.ව. 1762 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීමට පැමිණි ඉංග්‍රීසි රාජ දූතයා

(ජෝන් පයිබස්, රොබට් ඇන්ඩෲස්, ලොරෙන්සෝ ද අල්මේදා, ෆ්‍රැන්සිස්කු ද අල්මේදා, දෙවන රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ, ජෝරිස් වෑන් ස්පිල්බර්ජන්, සීබල් ද වාර්ට්) (ලකුණු 04 යි)

(iii) පෘතුගීසි ජාතිකයන්ට හා ලන්දේසි ජාතිකයන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට නොහැකි වූයේ ඇයිදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1818 උඩරට ඇති වූ නිදහස් සටන් ව්‍යාපාරය පිළිබඳව පහත දැක්වෙන ශීර්ෂ යටතේ කෙටි විස්තරයක් කරන්න.

*A* - එයට බලපෑ පසුබිම

*B* - නායකත්වය

*C* - සටන් ව්‍යාපාරය අසාර්ථක වීමට හේතු

(ලකුණු 06 යි)

6. (i) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට කඳුකර ප්‍රදේශවල අරඹන ලද වතුබෝග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(ii) වතුවගාව බහුල වශයෙන් ව්‍යාප්ත වූ කඳුකර දිස්ත්‍රික්ක **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)
(iii) වතුවගාවේ දියුණුවට හේතු වූ කෝල්බෲක් යෝජනා **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) වතුවගාව නිසා මෙරට ඇති වූ ආර්ථික හා සමාජමය වෙනස්කම් **එක** බැගින් දක්වා, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

7. (i) *A* - නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අගමැති
*B* - ක්‍රි.ව. 1972 ශ්‍රී ලංකා ජනරජයේ අගමැති
*C* - ක්‍රි.ව. 1978 ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රථම විධායක ජනාධිපති
**පිළිවෙළින්** නම් කරන්න. (ලකුණු 03 යි)
(ii) ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නව ඡන්ද විමසීම් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)
(iii) නිදහසින් පසු ගත වූ වසර තිහක පමණ කාලය තුළ දී බලයට පත් වූ රජයන් විසින් මෙරට ව්‍යාපාරික කෘෂිකර්මයේ දියුණුවට ගත් ක්‍රියාමාර්ග **දෙකක්** දක්වා, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)
(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

## III කොටස

8. (i) දහඅටවන ශතවර්ෂය වන විට යටත් විජිත පිහිටුවා ගෙන සිටි යුරෝපීය රටවල් **තුනක්** (බ්‍රිතාන්‍යය හැර) සඳහන් කරන්න. (ලකුණු 03 යි)
(ii) කාර්මික විප්ලව සමයේ ඇති වූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. ඒ හා සම්බන්ධ පුද්ගලයන් වරහනින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.
*A* - දුවන නඩාව
*B* - ආරක්ෂක ලාම්පුව
*C* - දුම් නැව
*D* - විදුලි පණිවුඩ ක්‍රමය
(ජෝන් කේ, ගුග්ලි මාර්කෝනි, සැමුවෙල් මෝස්, හෙන්රි බෙල්, රොබට් ෆුල්ටන්, තෝමස් නිව්කොමන්, හම්ෆ්‍රි ඩේවි, සැමුවෙල් ක්‍රොම්ප්ටන්) (ලකුණු 04 යි)
(iii) කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ යකඩ හා වානේ කර්මාන්තයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) කාර්මික විප්ලවයේ බලපෑම් හේතුවෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය කරුණු **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

9. (i) *A* - පළමු ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ රටවල් ගොඩනගා ගත් කඳවුරු **දෙක** ද
*B* - සරයේවෝ සිද්ධියෙන් ඝාතනයට ලක් වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුගේ නම ද
*A B* **අනුපිළිවෙළින්** දක්වන්න. (ලකුණු 03 යි)
(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු වරහනින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.
*A* - රුසියාව ආක්‍රමණය කර පරාජයට පත් වූ ප්‍රංශ අධිරාජයා
*B* - ක්‍රි.ව. 1934 දී මැංචූරියාවට ආක්‍රමණයක් එල්ල කළ රට
*C* - නට්සි විරෝධී සටනට බ්‍රිතාන්‍ය ජාතිකයන් පෙළඹ වූ එරට අගමැතිවරයා
*D* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටි ජනාධිපතිවරයා
(චාල්ස් ඩිගෝල්, නැපෝලියන් බොනපාට්, වුඩ්රෝ විල්සන්, ලොයිඩ් ජෝර්ජ්, ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්, ජර්මනිය, ජපානය, වින්ස්ටන් චර්චිල්) (ලකුණු 04 යි)
(iii) පළමුවන හා දෙවන ලෝක මහා සංග්‍රාමයන්ට ඇමෙරිකා එක්සත් ජනපදය සම්බන්ධ වීමට බලපෑ සිදුවීම් **දෙක** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)
(iv) ජාතීන්ගේ සංගමයට ලෝක සාමය ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම කෙරෙහි බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

* * *

292064

OL/2019/33-STE-II

සියලු ම හිමිකම් ඇවිරිණි ] முழுப் பதிப்புரிமையுடையது ]All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka


33 STE II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2019 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2019 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2019


ඉතිහාසය II
வரலாறு II
History II

1. (අ) (i)
1. (அ) (i)
1. (a) (i)

විභාග අංකය / சுட்டெண் / Index No. ..........................



1. (අ) (ii)
1. (அ) (ii)
1. (a) (ii)



ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்

අ.පො.ස.(සා.පෙළ) විභාගය - 2019
க.பொ.த (சா.தர)ப் பரீட்சை - 2019

විෂයය අංකය / பாட இலக்கம்: **33** | විෂයය / பாடம்: **ඉතිහාසය**

# I පත්‍රය - පිළිතුරු
# Iபத்திரம் - விடைகள்

| ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. | ප්‍රශ්න අංකය வினா இல. | පිළිතුරු අංකය விடை இல. |
|---|---|---|---|---|---|---|---|
| 01. | 04 | 11. | 04 | 21. | 03 | 31. | 04 |
| 02. | 01 | 12. | 01 | 22. | 01 | 32. | 04 |
| 03. | 03 | 13. | 01 | 23. | 03 | 33. | 02 |
| 04. | 04 | 14. | 03 | 24. | 01 | 34. | 03 |
| 05. | 02 | 15. | 02 | 25. | 02 | 35. | 01 |
| 06. | 04 | 16. | 03 | 26. | 04 | 36. | 03 |
| 07. | 04 | 17. | 03 | 27. | 04 | 37. | 01 |
| 08. | 03 | 18. | 02 | 28. | 02 | 38. | 02 |
| 09. | 02 | 19. | 01 | 29. | 02 | 39. | 02 |
| 10. | 02 | 20. | 01 | 30. | 03 | 40. | 04 |

විශේෂ උපදෙස් / விசேட அறிவுறுத்தல் } එක් පිළිතුරකට ලකුණු / ஒரு சரியான விடைக்கு **02** බැගින் / புள்ளி வீதம்

මුළු ලකුණු/ மொத்தப் புள்ளிகள் **02×40= 80**

පහත නිදසුනෙහි දැක්වෙන පරිදි බහුවරණ උත්තරපත්‍රයේ අවසාන තීරුවේ ලකුණු ඇතුළත් කරන්න.
கீழ் குறிப்பிடப்பட்டிருக்கும் உதாரணத்திற்கு அமைய பல்தேர்வு வினாக்களுக்குரிய புள்ளிகளை பல்தேர்வு வினாப்பத்திரத்தின் இறுதியில் பதிக.

| | | | |
|---|---|---|---|
| නිවැරදි පිළිතුරු සංඛ්‍යාව / சரியான விடைகளின் தொகை | 25 / 40 | I පත්‍රයේ මුළු ලකුණු / பத்திரம் I இன் மொத்தப்புள்ளி | 50 / 80 |

EXAMRESULTS.LK

### I කොටස

**(ආ)**

(i) A - පස්වන මිහිඳු/ පස්වන මහින්ද
B - සැමොරින්
C - ඉස්තාන්බුල්
D - අබ්දුල් ගමාල් නසාර්

*(ලකුණු 01 x 4 = 04 යි.)*

(ii) 1 - ගල්පොත
2 - කීර්ති ශ්‍රී නිශ්ශංකමල්ල / නිශ්ශංකමල්ල
3 - කාලිංග
4 - පොළොන්නරුව

*(ලකුණු 01 x 4 = 04 යි.)*

(iii) 1 - ඇඩොල්ෆ් හිට්ලර්
2 - ජර්මනිය
3 - නට්සිවාදය / නාසි
4 - ගෙස්ටාපෝ

*(ලකුණු 01 x 4 = 04 යි.)*

### II කොටස

2. **අභිමතාර්ථ :**

**ඉතිහාසය ගොඩ නැගීමට උපකාරී වන මූලාශ්‍රය ඒවායේ වැදගත්කම හා ඉතිහාසය ඉගෙනීමෙන් ලැබෙන ප්‍රයෝජන පිළිබඳ දැනුම හා අවබෝධය තුළනාත්මකව පිරික්සීම**

**2.** * (i) ශිලාලිපි නිර්මාණය කර ඇති ස්වරූපය අනුව වර්ග කළ හැකි ආකාර **තුනක්** දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත *A* සිට *D* දක්වා දී ඇති එක් එක් ප්‍රකාශයට අදාළ පිළිතුර වරහන් තුළින් තෝරා **අනුපිළිවෙළින්** ලියා දක්වන්න.

*A* - ශ්‍රී ලංකාවේ සිතියමක් අඳින ලද මුල්ම ග්‍රීක ජාතිකයා
*B* - අනුරාධපුර මුල් යුගයේ ශිලාලිපිවල භාවිත වූ අක්ෂරමාලාව හඳුන්වන නම
*C* - පුරාවිද්‍යාත්මක කැනීම්වලින් ශ්‍රී ලංකාවේ හමු වූ පැරණිතම කාසි හඳුන්වන නම
*D* - වසභ රාජ්‍ය සමයේ දී සෑභිගිරි (ඉසගිරි) ඇමතිවරයා විසින් නකදිව පාලනය කළ බව සඳහන් මූලාශ්‍රය

(මෙගස්තිනීස්, බ්‍රාහ්මී, සංස්කෘත, ටොලමි, කහාපණ, වල්ලිපුරම් රන් සන්නස, රිදී මස්ස, පනාකඩුව තඹ සන්නස) (ලකුණු 04 යි)

(iii) ඉතිහාසය ගොඩ නැගීමේ දී ශිලාලිපි වැදගත්වන ආකාරය කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ඉතිහාසය ඉගෙනීමෙන් ලද හැකි ප්‍රයෝජන **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) ලෙන් ලිපි, ගිරි ලිපි, ටැම් ලිපි, පුවරු ලිපි, ආසන ලිපි

*(ලකුණු 01 x 3 = 03 යි.)*

(ii) A - ටොලමි

B - බ්‍රාහ්මී

C - කහාපණ

D - වල්ලිපුරම් රන් සන්නස

*(ලකුණු 01 x 4 = 04 යි.)*

(iii)

- සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් නොවන කරුණු සෙල්ලිපි මගින් අනාවරණය කර ගත හැකි වීම
  - සමාජයේ තොරතුරු
  - ජනාවාස ව්‍යාප්තිය
  - විහාරවලට ගම්බිම් පිදීම
  - විහාරාරාම පාලනය
  - වෙළෙඳාම හා බදු
  - රජයේ නීතිරීති
- සිද්ධීන්වලට සමකාලීනව ලියැවීම නිසා විශ්වාසනීයත්වය වැඩිවීම
- අක්ෂරවල විකාශය පිළිබඳ තොරතුරු දැනගත හැකි වීම
- සාහිත්‍යය මූලාශ්‍රවල සඳහන් තොරතුරු සෙල්ලිපි මගින් තහවුරු කර ගත හැකි වීම

..........................................

*(ලකුණු 02 + 03= 05 යි.)*

(iv)

- තමා ජීවත්වන සමාජය හා ලෝකය පිළිබඳ යථාවබෝධය ලැබීමට හැකිවීම
- අතීත තොරතුරු මගින් වර්තමානය තේරුම් ගෙන අනාගතය ගොඩනඟා ගත හැකි වීම
- ජාතික අනන්‍යතාවය පිළිබඳ අවබෝධයක් ලබාගත හැකි වීම
- ජාතික සමගිය ගොඩ නැගීමට හැකි වීම
- අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීමට පුරුදු වීම
- විවිධ මත ඉවසීමට පුරුදු වීම
- ..........................................

*(ලකුණු 03 + 03= 06 යි.)*


NINE A | O/ L All Papers Download

**03. අභිමතාර්ථ :**

**ශ්‍රී ලංකාවේ පැවති එක් එක් ඓතිහාසික යුගවල දී සිදු වූ මානව ක්‍රියාකාරකම් පිළිබඳ දැනුම හා එම ක්‍රියාකාරකම් පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම.**

**3.** (i) ප්‍රාග් ඓතිහාසික මානවයන් මෙවලම් තැනීම සඳහා භාවිත කළ පාෂාණ වර්ග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - ප්‍රාග් ඓතිහාසික මානවයන් ජීවත් වූ පහතරට තෙත් කලාපීය ලෙන් **දෙකක්** ද,
*B* - ඔවුන් දඩයම් කළ සත්ව වර්ග **දෙකක්** ද **පිළිවෙළින්** ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) පූර්ව ඓතිහාසික යුගයේ මානව ජීවිතයේ ඇති වූ වෙනස්කම් **දෙකක්** විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) මුල් ඓතිහාසික යුගයේ දී ජනාවාස ව්‍යාප්ති රටාවේ වර්ධනය වූ ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) තිරිවානා (බිම් වීදුරු),
කහඳ
කළුගල්

*(ලකුණු 01 x 3 = 03 යි.)*

(ii) A - ලෙන්
පාහියන්ගල, බටදොඹලෙන, කිතුල්ගල බෙලිලෙන

B - ගවරා, කුළු මීහරකා, කළු වළහා, වල් ඌරා, ගෝනා, තිත්මුවා,
මිරිදිය මසුන්, කළපු, බෙල්ලන්

*(ලකුණු 02 + 02 = 04 යි.)*

(iii)

- පිළිස්සූ මැටි වළං භාවිතය ඇරඹීම
- ක්‍රමවත් සුසාන චාරිත්‍ර අනුගමනය කිරීම
- යකඩ ලෝහය භාවිතය ඇරඹීම
- ස්ථිරවාසීතාව
- කෘෂිකර්මාන්තයට යොමුවීම
- (කාන්තාවන්) රූපලාවණ්‍ය කටයුතුවලට යොමු වීම

*(ලකුණු 02 + 03 = 05 යි.)*

(iv)

- ජනාවාස ව්‍යාප්තිය භෞතික සාධක මත තීරණය වීම
(වර්ෂාපතනය ස්වභාවය, ප්‍රමාණය, පස, භූ විෂමතාව, ජලවහනය, ස්වාභාවික සම්පත්)
- කුඩා වැව් කේන්ද්‍ර කොට ජනාවාස ව්‍යාප්ත වීම
- ජනාවාස ගංගා නිම්නවලට පිටතින් පිහිටි ප්‍රදේශවල ව්‍යාප්ත වීම
- වැව් ගම්වලට අමතරව වෘත්තීන් මත පදනම්ව ජනාවාස ව්‍යාප්ත වීම
(ගෝපාලගාම, කුම්භකාරගාම ........)
- පරික්ඛිත ගම් හා අපරික්ඛිත ගම්
- පුර හා නගර ජනාවාස
- කාර්යය මත පදනම් වූ ගම් (නියම් ගම්, පටුන් ගම්)

*(ලකුණු 03 + 03 = 06 යි.)*



E ALL Papers Download

## 04. අභිමතාර්ථ :

**අතීත ශ්‍රී ලංකාවේ දියුණුව පැවති විවිධ ක්ෂේත්‍රවල තාක්ෂණික විශිෂ්ටත්වය පිළිබඳ දැනුම හා අවබෝධය තුලනාත්මක ව පිරික්සීම.**

4. (i) *A* - කුඩා ස්තූප ආවරණය කිරීම සඳහා තැනූ ගොඩනැගිල්ල
*B* - වැවක ඇතිවන දිය රැළිවලින් වැව් බැම්ම සේදී යාම වැළැක්වීම සඳහා කළ නිර්මාණය
*C* - අකුණු සැරවලින් ආරක්ෂා වීම සඳහා විශාල ස්තූප මුදුනේ සවි කළ උපකරණය
**පිළිවෙළින්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) *A* - මහවැලි ගඟ හා සම්බන්ධ පැරණි ඇළ මාර්ග **දෙකක්** ද
*B* - කලා ඔය හා මල්වතු ඔය හරස්කොට බඳවන ලද විශාල වැවක් බැගින් ද ලියා දක්වන්න. (ලකුණු 04 යි)

(iii) උද්‍යාන අලංකරණය, ආරක්ෂාව වැනි කරුණු පදනම් කරගෙන පැරණි නගර නිර්මාණ තාක්ෂණයක් පැවති බව සීගිරිය ඇසුරෙන් පෙන්වා දෙන්න. (ලකුණු 05 යි)

(iv) අතීතයේ දී මෙරට දියුණු වෛද්‍ය සේවාවක් පැවති බව කරුණු **තුනක්** ඉදිරිපත් කරමින් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i)
A - වටදාගෙය / ස්තූපඝර
B - රළපනාව / සළපනාව
C - වජ්‍ර චුම්බට

*(ලකුණු 01 x 3 = 03 යි.)*

(ii)
A - මිණිපේ ඇළ, ඇළහැර ඇළ, අංගමැඩිල්ල ඇළ
B - කලා ඔය - කලා වැව
C - මල්වතු ඔය - නාච්චදූව වැව

*(ලකුණු 02 + 02 = 04 යි.)*

(iii)

- උද්‍යාන අලංකරණය
  - සැලසුම්ගත උද්‍යාන සංකීර්ණයක් දක්නට ලැබීම
  - අලංකරණය සඳහා ජලමල් හා පොකුණු භාවිතා කළ බව පුරාවිද්‍යා සාධකවලින් සනාථ වීම
  - නගරය ආශ්‍රිතව නිර්මාණය කරන ලද වැවක් තිබීම
- ආරක්ෂාව
  - නගරය වටා ගැඹුරු දිය අගලක් තනා තිබීම
  - ආරක්ෂාව සඳහා උස් වූ (ගඩොලින් තැනූ) ප්‍රාකාරයක් දක්නට තිබීම
  - ආරක්ෂිත ප්‍රවේශ දෙකක් පිහිටා තිබීම

(යටත් පිරිසෙන් අලංකරණය හා ආරක්ෂාව ගැන එක් කරුණක්වත් ඇතුළත් විය යුතුය)

*(ලකුණු 02 + 03 = 05 යි.)*

(iv)

- දියුණු වෛද්‍ය සේවාවක් පැවැති බව සාහිත්‍ය මූලාශ්‍රවල සඳහන් වීම
  - පණ්ඩුකාභය රාජ්‍ය සමයේ සිවිකා ශාලා ගැන සඳහන් වීම දුටුගැමුණු රජු රෝහල් 18 ක් ඉදි කිරීම, බුද්ධදාස රජ වෛද්‍යවරයකු ලෙස කටයුතු කළ බව, සතුන්ට වෙදකම් කිරීම ආදිය.
- පුරා විද්‍යාත්මක තොරතුරු
  - පැරණි රෝහල් පිළිබඳ නටබුන් හමුවීම (මිහින්තලේ, ආලාහන පිරිවෙන)
  - සැත්කම් උපකරණ හමුවීම (ආලාහන පිරිවෙන)
  - බෙහෙත් ඔරු හා ඇඹරුම් ගල් (මිහින්තලේ හා ආලාහන පිරිවෙන)
  - ඔසු උයන් පිළිබඳ තොරතුරු
- වෛද්‍යවරුන් සඳහා ගම්බිම් වෙන් කිරීම

*(ලකුණු 03 + 03 = 06 යි.)*

05. **අභිමතාර්ථ :**

**පෘතුගීසි ආගමනය සිදුවන විට ශ්‍රී ලංකාවේ පැවති දේශපාලන පසුබිම, උඩරට රාජ්‍ය යටත් කර ගැනීමට පෘතුගීසීන්ට හා ලන්දේසීන්ට නොහැකි වීමට බලපෑ හේතු හා බ්‍රිතාන්‍ය විරෝධී පළමු නිදහස් අරගලය පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම**

5. (i) පෘතුගීසින් ශ්‍රී ලංකාවට පැමිණෙන විට තිබූ රාජධානි **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) පහත A සිට D දක්වා ඇති ප්‍රකාශවලට ගැළපෙන පිළිතුරු වරහන තුළින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

A - ක්‍රි.ව. 1505 දී ගාල්ලට ගොඩබට පළමු පෘතුගීසි නාවිකයා

B - ක්‍රි.ව. 1602 දී පළමුවන විමලධර්මසූරිය රජු හමුවීමට පැමිණි ලන්දේසි රාජ දූතයා

C - ක්‍රි.ව. 1638 දී ලන්දේසීන් සමග ගිවිසුමක් ඇතිකරගත් උඩරට රජතුමා

D - ක්‍රි.ව. 1762 දී කීර්ති ශ්‍රී රාජසිංහ රජු හමුවීමට පැමිණි ඉංග්‍රීසි රාජ දූතයා

(ජෝන් පයිබස්, රොබට් ඇන්ඩෘසේ, ලොරෙන්සෝ ද අල්මේදා, ෆ්‍රැන්සිස්කු ද අල්මේදා, දෙවන රාජසිංහ, ශ්‍රී වික්‍රම රාජසිංහ, ජෝරිස් වෑන් ස්පිල්බර්ජන්, සිබල් ද වාර්ට්) (ලකුණු 04 යි)

(iii) පෘතුගීසි ජාතිකයන්ට හා ලන්දේසි ජාතිකයන්ට උඩරට රාජධානිය යටත් කර ගැනීමට නොහැකි වූයේ ඇයිදැයි කරුණු **දෙකක්** ඇසුරෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) ක්‍රි.ව. 1818 උඩරට ඇති වූ නිදහස් සටන් ව්‍යාපාරය පිළිබඳව පහත දැක්වෙන ශීර්ෂ යටතේ කෙටි විස්තරයක් කරන්න.

A - එයට බලපෑ පසුබිම

B - නායකත්වය

C - සටන් ව්‍යාපාරය අසාර්ථක වීමට හේතු

(ලකුණු 06 යි)

(i) කෝට්ටේ, මහනුවර, යාපනය

*(ලකුණු 01 x 3 = 03 යි.)*

9A

(ii)

A - ලොරෙන්සෝ ද අල්මේදා

B - ජෝරිස් ෆන් ස්පිල්බර්ජන්

C - දෙවන රාජසිංහ

D - ජෝන් පයිබස්

*(ලකුණු 01 x 04 = 04 යි.)*

(iii)

- උඩරට රාජධානියේ ස්වභාවික පිහිටීම (කඳු, ගංගා, වනාන්තර)
- උඩරට ජනතාවගේ රාජපාක්ෂික බව
- උඩරැටියන්ගේ සටන් උපක්‍රම (ගරිල්ලා සටන්ක්‍රම)
- රජවරුන්ගේ උපායශීලි බව
- තීරණාත්මක අවස්ථාවන්හිදී කුළු හමුදා (ලස්කිරිඤ්ඤ හමුදා)උඩරට රජුට පක්ෂපාතී වීම

*(ලකුණු 02 + 03 = 05 යි.)*

(iv)

A - පසුබිම

- නිදහස අහිමි වීම හා රජෙකු නැතිවීම පිළිබඳ උඩරැටියන් තුළ ඇති වූ පසුතැවිල්ල
- ආගම හා සංස්කෘතියේ ආරක්ෂාව පිළිබඳ ගැටලු
- උඩරට ප්‍රභූ පන්තියට පහර වැදීම

B - නායකත්වය

- කැප්පැටිපොල, මඩුගල්ලේ, පිළිමතලාවේ බූටෑවේ රටේ රාළ .............

C - අසාර්ථක වීමට හේතු

- ඉංග්‍රීසීන් අනුගමනය කළ දැඩි මර්දනකාරි ප්‍රතිපත්තිය (බිම්පාලු ප්‍රතිපත්තිය, නායකයන් ඝාතනය)
- බ්‍රිතාන්‍යයන්ගේ යුධ ශක්තිය
- දීර්ඝ කාලීන සටනකට අවශ්‍ය අවිආයුධ හෝ වෙනත් සම්පත් උඩරැටියන්ට නොතිබීම
- සටනේ අසංවිධානාත්මක ස්වරූපය
- සිංහල නායකයන් අතර මතභේද ඇතිවීම
- සමහර නායකයන් ඉංග්‍රීසීන්ට සහාය දැක්වීම (මොල්ලිගොඩ, එක්නැලිගොඩ)
- රජු හැටියට ඉදිරිපත් වූ දොරේසාමිට රාජ්‍ය උරුමයක් නැති බව හෙළිවීම

*(ලකුණු 02 x 03 = 06 යි.)*

NINE A | O/ L All Papers Download

9A

## 06. අභිමතාර්ථ :

**බ්‍රිතාන්‍යයන් ඇරඹූ වතු වගාව නිසා මෙරට ආර්ථික හා සමාජ ක්ෂේත්‍රවල ඇති කරන ලද වෙනස්කම් පිළිබඳ දැනුම හා අවබෝධය පිරික්සීම**

6. (i) බ්‍රිතාන්‍යයන් විසින් මෙරට කඳුකර ප්‍රදේශවල අරඹන ලද වතුබෝග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි)
   (ii) වතුවගාව බහුල වශයෙන් ව්‍යාප්ත වූ කඳුකර දිස්ත්‍රික්ක **හතරක්** දක්වන්න. (ලකුණු 04 යි)
   (iii) වතුවගාවේ දියුණුවට හේතු වූ කෝල්බෲක් යෝජනා **දෙකක්** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)
   (iv) වතුවගාව නිසා මෙරට ඇති වූ ආර්ථික හා සමාජමය වෙනස්කම් **එක** බැගින් දක්වා, ඒවා කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i) කෝපි, සිංකෝනා, කොකෝවා, තේ. රබර්

*(ලකුණු 01 x 3 = 03 යි.)*

(ii) මහනුවර, නුවරඑළිය, මාතලේ, රත්නපුර, බදුල්ල, කෑගල්ල

*(ලකුණු 01 x 4 = 04 යි.)*

(iii)

- පෞද්ගලික ව්‍යවසායකයන්ට රජයේ ඉඩම් මිළදී ගැනීමට හැකිවන පරිදි ඉඩම් විකිණීමේ ප්‍රතිපත්තියක් යෝජනා කිරීම
- සිවිල් නිලධාරීන්ට වතු වගාව සඳහා අවසර ලබා දීම
- වතුවගාවට ශ්‍රමය ලබා ගැනීම සඳහා අනිවාර්ය සේවා රාජකාරි ක්‍රමය අහෝසි කිරීම
- ව්‍යවසායකයන්ට ණය දීම සඳහා බැංකුවක් පිහිටු වීම

*(ලකුණු 02 + 03 = 05 යි.)*

(iv) ආර්ථික වෙනස්කම්

- ස්වයං පෝෂිත අර්ථ ක්‍රමය පිරිහීමට පටන් ගැනීම
- ආනයන-අපනයන අර්ථ ක්‍රමයකට යොමු වීම
- වතු භෝගවලින් ලැබුණු ආදායම රජයේ ප්‍රධාන ආදායම් මාර්ගය වීම
- සාම්ප්‍රදායික රැකියාවලට අමතරව විවිධ රැකියා ක්ෂේත්‍ර බිහිවීම (ගමනාගමන, සන්නිවේදන හා බැංකු ක්ෂේත්‍ර ආශ්‍රිත රැකියා)

සමාජ වෙනස්කම්

- මධ්‍යම පන්තියක් බිහිවීම
- කම්කරු පන්තියක් බිහිවීම
- ධනය මත සමාජ තත්ත්වය තීරණය වීම
- උඩරට ප්‍රදේශවල ඉඩම් අහිමි ජනතාවක් බිහිවීම

*(ලකුණු 03 + 03 = 06 යි.)*

NINE A | O/ L All Papers Download

## 07. අභිමතාර්ථ :

**නිදහසින් පසු ශ්‍රී ලංකාවේ දේශපාලන හා ආර්ථික ක්ෂේත්‍රයෙහි ඇති වූ වෙනස්කම් පිළිබඳ සංශ්ලේෂණාත්මකව අවබෝධය පිරික්සීම.**

7. (i) *A* - නිදහස් ශ්‍රී ලංකාවේ පළමු අගමැති
*B* - ක්‍රි.ව. 1972 ශ්‍රී ලංකා ජනරජයේ අගමැති
*C* - ක්‍රි.ව. 1978 ශ්‍රී ලංකා ජනරජයේ ප්‍රථම විධායක ජනාධිපති
**පිළිවෙළින්** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) ක්‍රි.ව. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හඳුන්වාදුන් නව ඡන්ද විමසීම් ක්‍රම **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) නිදහසින් පසු ගත වූ වසර තිහක පමණ කාලය තුළ දී බලයට පත් වූ රජයන් විසින් මෙරට ව්‍යාපාරික කෘෂිකර්මයේ දියුණුවට ගත් ක්‍රියාමාර්ග **දෙකක්** දක්වා, ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 05 යි)

(iv) නිදහසින් පසු ශ්‍රී ලංකාවේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුව සඳහා ගත් ක්‍රියාමාර්ග **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(i)
A - ඩී.එස්. සේනානායක මහතා
B - සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය
C - ජේ.ආර්. ජයවර්ධන මහතා

***(ලකුණු 01 x 03 = 03 යි.)***

(ii)

- ජනාධිපතිවරණය
- සමානුපාතික නියෝජන ක්‍රමය
- ජනමත විචාරණය

(මින් දෙකක්)

***(ලකුණු 02 x 02 = 04 යි.)***

(iii)

- 1952 චීන - ශ්‍රී ලංකා රබර් සහල් ද්විපාර්ශවික ගිවිසුම ක්‍රියාත්මක කර රබර් සඳහා ස්ථාවර වෙළඳපොලක් ලබා ගැනීම
- රාජ්‍ය අංශය සතු වූ ඉඩම් කළමනාකරණය සඳහා ආයතන කිහිපයක් පිහිටුවීම
  - 1958 රාජ්‍ය වැවිලි සංස්ථාව
  - 1976 උඩරට වතු සංවර්ධන මණ්ඩලය
  - 1976 ජනතා වතු සංවර්ධන මණ්ඩලය
- 1975 ඉඩම් ප්‍රතිසංස්කරණය මගින් පොදු සමාගම් සතු ඉඩම් ජනසතු කිරීම
- 1977 සිට තේ හා රබර් නැවත වගාවට ආධාර ලබා දීම (පැළ. පොහොර, උපදෙස් ලබා දීම)

***(ලකුණු 02 + 03 = 05 යි.)***

NINE A | O/ L All Papers Download

9A

(iv)

- කාර්මික ජනපද පිහිටුවීම
  (ඒකල හා රත්මලාන)
- කර්මාන්ත සඳහා ණය ලබා දීම
- ප්‍රමිති කාර්යාංශය මගින් කාර්මික නිෂ්පාදනවල ප්‍රමිතිය තීරණය කිරීම
- ආයාත ආදේශන ප්‍රතිපත්තිය තුළින් ගෘහ කර්මාන්ත හා සුළු කර්මාන්ත දියුණු කිරීම
- රජය මගින් මහා පරිමාණ කර්මාන්ත ඇරඹීම
  (සිමෙන්ති, යකඩ හා වානේ, තුනී ලෑලි , සීනි .....)
- අපනයන සැකසුම් කලාප පිහිටු වීම
  (කටුනායක, බියගම, කොග්ගල)

*(ලකුණු 03 + 03 = 06 යි.)*

## III කොටස

08. අභිමතාර්ථ :

**කාර්මික විප්ලවය හා සම්බන්ධ පසුබිම් තොරතුරු පිළිබඳ දැනුම ද, එහි බලපෑම නිසා කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය පිළිබඳ තුලනාත්මක අවබෝධය පිරික්සීම.**

8. (i) දහඅටවන ශතවර්ෂය වන විට යටත් විජිත පිහිටුවා ගෙන සිටි යුරෝපීය රටවල් **තුනක්** (බ්‍රිතාන්‍ය හැර) සඳහන් කරන්න. (ලකුණු 03 යි)

(ii) කාර්මික විප්ලව සමයේ ඇති වූ නව නිපැයුම් කිහිපයක් පහත දැක්වේ. ඒ හා සම්බන්ධ පුද්ගලයන් වරහනින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - ද්‍රුවන නඩාව
*B* - ආරක්ෂක ලාම්පුව
*C* - දුම් නැව
*D* - විදුලි පණිවුඩ ක්‍රමය

(ජෝන් කේ, ගුග්ලි මාර්කෝනි, සැමුවෙල් මෝස්, හෙන්රි බෙල්, රොබට් පුල්ටන්, තෝමස් නිව්කොමන්, හම්ප්‍රි ඩේවි, සැමුවෙල් ක්‍රොම්ප්ටන්) (ලකුණු 04 යි)

(iii) කාර්මික විප්ලව සමයේ බ්‍රිතාන්‍යයේ යකඩ හා වානේ කර්මාන්තයේ ඇති වූ දියුණුව නිදසුන් **දෙකක්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) කාර්මික විප්ලවයේ බලපෑම් හේතුවෙන් කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ ඇති වූ වර්ධනය කරුණු **තුනක්** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) පෘතුගාලය, ස්පාඤ්ඤය. ඕලන්දය, ප්‍රංශය

*(ලකුණු 01 x 3 = 03 යි.)*

(ii) A - ජෝන් කේ
B - හම්ප්‍රි ඩේවි
C - හෙන්රි බෙල්
D - සැමුවෙල් මෝස්

*(ලකුණු 01 x 04 = 04 යි.)*



NINE A L O/ L All Papers Download

(iii)

- යපස් උණු කිරීම සඳහා දර වෙනුවට ගල් අඟුරු භාවිත කිරීම (ඒබ්‍රහම් ඩර්බි)
- හෙන්රි කෝට් විසින් රෝලර් යන්ත්‍රය නිපදවීම නිසා යකඩ පදම් කිරීම දියුණු වීම
- හෙන්රි බෙසමර් විසින් පිරිසිදු වානේ නිපදවීමේ ක්‍රමය හඳුන්වා දීම
- විවෘත උඳුන් ක්‍රමය හඳුන්වා දී උසස් තත්ත්වයේ වානේ නිපදවීම
- යපස් උණු කිරීමට විදුලි උඳුනක් නිපදවීම (විලියම් සීමන්ස්)

*(ලකුණු 02 + 03 = 05 යි.)*

(iv)

- මහා පරිමාණ ගොවි බිම් ආරම්භ කිරීම
- ශෂ්‍ය මාරු ක්‍රමය හඳුන්වා දීම
- සත්ව පාලන කටයුතු සඳහා නව තාක්ෂණය යොදා ගැනීම
- නව කෘෂි කාර්මික ක්‍රම හා උපකරණ භාවිතය
- දෙමුහුන් බීජ වර්ග නිපදවීම
- ............

*(ලකුණු 03 + 03 = 06 යි.)*

09. **අභිමතාර්ථ :**

**ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ පාර්ශව හා සුවිශේෂ පුද්ගලයන් පිළිබඳ දැනුම, ලෝක සාමය රැක ගැනීමට පිහිට වූ පළමු ජගත් සංවිධානයේ අසාර්ථකත්වයට බලපෑ හේතු පිළිබඳ විශ්ලේෂණාත්මක අවබෝධය පිරික්සීම.**

**9.** (i) *A* - පළමු ලෝක මහා සංග්‍රාමයට සම්බන්ධ වූ රටවල් ගොඩනගා ගත් කඳවුරු **දෙක** ද

*B* - සරයේවෝ සිද්ධියෙන් ඝාතනයට ලක් වූ ඔස්ට්‍රියාවේ ඔටුන්න හිමි කුමරුගේ නම ද

*A B* **අනුපිළිවෙළින්** දක්වන්න. (ලකුණු 03 යි)

(ii) පහත සඳහන් තොරතුරුවලට අදාළ පිළිතුරු වරහනින් තෝරා **අනුපිළිවෙළින්** දක්වන්න.

*A* - රුසියාව ආක්‍රමණය කර පරාජයට පත් වූ ප්‍රංශ අධිරාජයා

*B* - ක්‍රි.ව. 1934 දී මැංචූරියාවට ආක්‍රමණයක් එල්ල කළ රට

*C* - නට්සි විරෝධී සටනට බ්‍රිතාන්‍ය ජාතිකයන් පෙළඹ වූ එරට අගමැතිවරයා

*D* - දෙවන ලෝක මහා සංග්‍රාම සමයේ ඇමෙරිකා එක්සත් ජනපදයේ සිටි ජනාධිපතිවරයා

(චාල්ස් ඩිගෝල්, නැපෝලියන් බොනපාට්, වුඩ්රෝ විල්සන්, ලොයිඩ් ජෝර්ජ්, ෆ්‍රැන්ක්ලින් රූස්වෙල්ට්, ජර්මනිය, ජපානය, වින්ස්ටන් චර්චිල්) (ලකුණු 04 යි)

(iii) පළමුවන හා දෙවන ලෝක මහා සංග්‍රාමයන්ට ඇමෙරිකා එක්සත් ජනපදය සම්බන්ධ වීමට බලපෑ සිදුවීම් **දෙක** සැකෙවින් විස්තර කරන්න. (ලකුණු 05 යි)

(iv) ජාතීන්ගේ සංගමයට ලෝක සාමය ආරක්ෂා කර ගැනීමට නොහැකි වීම කෙරෙහි බලපෑ හේතු **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(i) A - මිත්‍ර පක්ෂය හා මධ්‍යම බලවතුන්

B - ප්‍රාන්ස් ෆර්ඩිනන්ඩ් කුමරු

*(ලකුණු 02 + 01 = 03 යි.)*

NINE A | O/ L All Papers Download

9A

(ii) A - නැපෝලියන් බොනපාට්

B - ජපානය

C - වින්ස්ටන් චර්චිල්

D - ෆ්‍රෑන්ක්ලින් රූස්වෙල්ට්

*(ලකුණු 01 x 04 = 04 යි.)*

(iii)

පළමුවන ලෝක සංග්‍රාමය

- ඇමරිකානු මගීන් රැගත් ලුසිටානියා නමැති මගී නැව ජර්මන් සබ්මැරීනයක් මගින් ගිල්වා දැමීම

දෙවන ලෝක සංග්‍රාමය

- හවායි දූපතේ පර්ල් වරායේ හමුදා කඳවුර ජපානයේ ආක්‍රමණකාරී ප්‍රතිපත්තියට බාධාවක් වූ බැවින් ජපානය විසින් පර්ල් වරායේ ඇමරිකානු නාවුක හමුදා කඳවුරට බෝම්බ හෙළා විනාශ කිරීම

*(ලකුණු 02 + 03 = 05 යි.)*

(iv)

- ධනවත් මෙන්ම යුධ බලවතෙකු වූ අමෙරිකා එක්සත් ජනපදය ජාතීන්ගේ සංගමයේ සාමාජිකත්වය ලබා නොගැනීම
- තවත් බලවත් රටක් වූ රුසියාව ජාතීන්ගේ සංගමයෙන් ඈත් කර තැබීම
- ගනු ලැබූ තීරණ ක්‍රියාත්මක කිරීම සඳහා සාමාජිකයන් පොළඹවා ගැනීමට ජාතීන්ගේ සංගමය අපොහොසත් වීම
- සාමාජික රටවල් අතර එකමුතුකමක් නොතිබීම
- ජාතීන්ගේ සංගමයට ස්ථාවර හමුදාවක් නොසිටීම හා සාම හමුදාවක් යොදා ගැනීමට පොදු එකඟතාවයක් නොවීම
- ලෝක සාමය කඩ කළ රටවලට එරෙහිව ක්‍රියා කිරීමට ජාතීන්ගේ සංගමය අපොහොසත් වීම

*(ලකුණු 03 + 03 = 06 යි.)*

9A